

සිහින රූ
සඳුට අත දුර
වලා ගැවසුන
කඳු මුදුන මත
සිහින තනනෙමි
සඳේ රැස් මැද
වලා කැරලිති
අමුණලා නුඹේ
රුවම අඹනෙමි
සිහින රූ හැම
පුරා පැසකට
දෑත ළඟකින්
නිතර තබනෙමි
කටුක ලොව මැද
සිය දහස් වර
කඳු මුදුන මත
සිතින් සරනෙමි

*මාලිති විජේසේකර*

# මිනිස් දිවි

මිනිසත් බවට එක්වන සැම දුදන කම
ලෝකය වැළඳ ගෙන දුක්වන කරුණු කිම
යහගුණ වලට පෙළඹීමට අසල කම
සිදුවුනෙ මිනිස් ගතිවල ඇති දුබල කම

යහපත් මිනිස් ගති ඇති සැමදෙනා හ ට
මුළු ජීවිතයෙ දුක මැඩගෙන එයි සතු ට
සැනසුම ළඟා වෙයි මරණය ළගම සි ට
හුරුවනු මැනවි දින දින ගුණවත් වැඩ ට

අප හැම දෙනාටම අයිතියි මිනිස් ක ම
උස් මිටි බවක් සිදුවෙයි එහි ඉබේට ම
දරුවන් දිරිය කොතරම් එකිනෙකා ත ම
හදෙහි ගුණය පමණට වෙයි සැබ ලැබු ම

මිනිස් හදට හැකියාවක් එමට ඇ ත
එනමුත් හොඳ නරක මුමුනයි මනස ම ත
යහමග යන්නවුන් කරවා පරාජි ත
දැනුමක් ලබන්නට වෙරදෙයි පාපි සි ත

ඇස කණ පිරෙයි අනුකම්පා පුවත් ව ල
එනමුත් හදවතෙහි නැත කරුණාවෙ ප ල
ගත සිත පුරා එක් වන මේ කුණු කස ල
ඉවතට යන්න දෙවියනි; පෙන්වන්න බ ල

## දයා අත්තනායක
බටුවත්ත
ශ්‍රී ලංකාව

# එරබදු

## රත්න ශ්‍රී විජේසිංහ



මිත්‍ර වරුනි ගස අඩි විසි පහක් ඇතී
පත්‍ර විතරමයි ගෙඩි මල් කිසිත් නැතී
වෘක්ෂ දේවතාවොත් පිට මග ම යතී
මුත්‍ර කරන්නට විතරක් මුලට එතී

සාර සුබාවට ගස වැඩෙමින් රුවට
සාර සියක් අතු ඉති වැනුණත් අවට
බෝධි සත්වයින්ගේ හෙවණට ඉහට
බෝධි රාජයෙක් වනු බැරි විය ගහට

නීල වර්ණ නිල් චාමර කොළ තුරිනේ
මෝදු වුණයි රතු කැකුළක් ගස මුදුනේ
පාරමිතා මිණිමුතු වී මල පිපුණේ
යාළු, එයට එරබදු. යන නම ලැබුණේ

රනේ රුවට රන් කිරුළක අන්දමට
පෙනේ සුරත් මල ගහ උඩ තුන් යමට
මලේ වරුණ පවසන මහ පිංකමට
අනේ යෝද බල ලැබියන් දරුවන්ට

ඉතින් යහළුවනි මල් පිපුණොත් ගසක
සැකක් නැතිය පලයක් හට ගනු නිසැක
සිතින් අත නෑර මල් වල මුදු මෙළෙක
වරෙව් පරාගණයට රොද බැඳ හනික

සුබ උදෑසන (1988)

# මගේ චූටි පුතු ට

අයියාට කවි ලියුවත්
නැත ලියුවේ නුඹට නම්
චූටි පුතු මගේ රන්
ආදරේ නෑ මගේ අඩුවක්

අඩුවක් නොදැනෙන්න
චූටි හිත නොරිදන්න
අද ලැබුණ මට ඉඩක්
ඔබටත් කවියක් ලියන්න

මව්පියන්ට රට දැයට
බරක් නොව ආඩම්බරයක්ම වෙන්න
වැඩෙනු මැන මගෙ පුතේ
අපි නැති දිනක මතුයම්
ඔබයි අයියයි පමණි

ලක් මවට ගරු නම්බු
ලබා දෙනු පිණිස හෙට
ජීවිතේ ජය ගන්න
හොඳ මිනිසුන්ම වෙන්න !

## ප්‍රසාදිනී වෙත්තසිංහ

# පහන් වැට

## *අපේ පැදියට ගිය කල !*

*"බටහිර*
*යොවුන් සාහිත්‍යය*
*ඉතා පොහොසත් ය.*
*එයට*
*ප්‍රධාන හේතුව*
*වැඩියෙන්*
*යොවුන් සාහිත්‍ය කෘති*
*බිහි වීම නොව*
*ඒ රටවල දරුවන්*
*කුඩා වියේ සිටම*
*පොතට පතට*
*හුරුකර තිබීම ය්.*
*දරුවාට*
*මාස හයේ සිට*
*මව හෝ පියා හෝ*
*කතන්දර පොත්*
*දරුවාට ඇසෙන්නට*
*කියවයි."*
*අපේ ජගතාගෙ*
*"ඉස්කෝලෙ කාලෙ"*
*නවලුවේ*
*"පසු බිම් කතාව"*
*පටන් ගෙන ඇත්තේ*
*වැකි හයකින් සැදුනු*
*කුඩා කැඩියකිනි.*
*ගැදියෙන් ලියා ඇති*
*එ-කැඩියෙන් ඇර-ගත්*
*මේ වැකි තුන*
*මේ විදියට*
*ගැදි-පැදියකින්*
*ලියන්න හිතුනේ*
*පසුගිය සන්නසේ*
*"පහන් වැටේ"*
*එල්ලා තිබුනු*
*එක්තරා පැබැඳුමක්*
*කියවීමෙන් පසුව*
*ඇති වු සිත් තැව්ලත්*
*කලකිරීමත් නිසාම ය.*

*වි. ක. ධර්මබන්ධු*

# මගේ අදිටන

## පියන්කාරගේ බන්දුල ජයවීර

මොන තරම් හැඩ
වුණත් මුහුණේ
කොතරම් අජුව ද
රවා බලනා කලට
ලහරි හැඩයි ඔබ
රවා බැලුවත්ල
මෝඩ පිරිමින් එහෙම කීවත්
හිනා වුණි නම්
හැඩ තමයි ඔබ

ඒත් කෝමද
හදවතේ කුණු
විස පුරෝ ගෙන
හිනා වෙන්නේ

ඇත්ත
ඇති සැටියෙන් ම පෙන්වා
ඉතින් ස්තූති
රවා බැලුවටඃ
ඔබට එරෙහි ව
මගේ ආයුද
රහසේ ම මම
තමා මුවහත
කල් ගෙවා මුත්
බලා ඉන්නෙමි
මට රැවූ ඒ
"ඇස් සහිත හිස"
ගෙලින් සිඳ මම
සිනාසෙන්නෙමි

# නිමල පැතුම

මගේ දුව දැන්ද ආවේ
තිබහද බඩගිනි නැතිද
ඔබේ මුවින් නික්මුණු ඒ වදන්
සිහිනෙන් ගෑ සුවඳක් වගේ

නුඹේ ගත සවි දියවන තුරුම
හදා වඩා අප සෙනෙහසින්
දියණියකව බිරිඳකව මවක මිත්තණියකව
ඉටු කලා අප සැමට යුතුකම්

මා මිහිපිට දුටු දෙවඟන ඔබමය
ජීවිත උයනේ ලෙළදුන් මුදු කුසුමද ඔබමය
දිවියේ සැප දුක සමව දරාගත්
මිත්තනියේ ඔබ යශෝදරාවකි මට

අසාර වූ සංසාරේ
මගේම මිත්තණියම වේවා
පැතූ යම් බෝධියකින් මතු දින
උතුම් වූ නිවන අවබෝධ වේවා !

## සුභාෂිනී බුද්ධසිරි
බෙරික්



**ADELAIDE CITY**
Siri Jayaweera

*The University of Adelaide*
*Sits along the busy North Terrace*
*Royal Hospital and the Faculty of Medicine*
*Border the Form Street shady arcade*

*Beside the Botanical garden*
*Torrents River flowing gently*
*Through the meadows, profusely Green*
*Beyond the precincts of University*
*Warbling birds, Parrots and Sea Gulfs,*
*Vying around in the gentle breeze*
*In abundant glee*

*The majestic churches that rise to sky*
*With their obelisks, sleek and high*
*Mayraid of Churches in impeccable beauty*
*In and around the Adelaide city*
*With breathtaking architecture,*
*Historical monuments of colonial past*
*Quaint cathedrals scattered around, it's so vast*
*Epitomize the British Legacy*
*Left behind by Her Majesty*

*Buildings old and modern tall and high*
*Vying to touch the sky*
*Facades are lit with mayraid of hue*
*Transmuting the city into glorious mood*
*With breathtaking beauty in the Christmas Eve*
*Festival times in summer height*

*The oldest German settlement, picturesque Handroff*
*With quaint landscapes with prolific birdlife*
*Arrays of vine yards scattered around*
*Villages with rural charm, Bavarian decent*